# කෝට්ටේ යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මධූෂාන් අයි. එම්. එම්.
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
madushamilinda9@gmail.com

**සාරසංක්ෂේපය**

මහින්දාගමනය හේතු කරගෙන බ්‍රාහ්මී අක්ෂර මාලාව හිමි වූ අතර ක්‍රි. පූ. තුන්වන සියවසේ දී ලේඛන කලාවෙහි ආරම්භය සිදුවිය. මුල් කාලයේ දී එම ලේඛන කලාව භාවිත කරමින් ලෙන් ලිපි වැනි දේ සටහන් කරන ලදි. ඉන්පසු සාහිත්‍යය බිහි විය. එය සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ලෙස හඳුන්වනු ලැබේ. එකී සම්භව්‍ය සිංහල සාහිත්‍යය ලංකාවේ එක් එක් යුගයන්හි යම් යම් වෙනස්කම්වලට භාජනය වෙමින් දියුණු විය. එලෙස සාහිත්‍යයේ දියුණුවට පත් වූ යුගයක් ලෙස කෝට්ටේ යුගය නම් කිරීමට පිළිවන. එම යුගයෙහි සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු තෝරාගත් මූලාශ්‍රය කිහිපයක් ඇසුරෙන් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයේ එතරම් සාහිත්‍යයේ දියුණුවක් ඇති වීමට හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඊට තොරතුරු සපයා ගැනීමට ප්‍රාථමික මුලාශ්‍රයත් ද්වීතියික මූලාශ්‍රයත් මඟින් විමර්ශනය සිදුකරන ලදි. කෝට්ටේ යුගයේ විවිධ වර්ගයේ ග්‍රන්ථ රාශියක් රචනා වූ බව **මහාවංසයේ** තෙවන කොටසෙහි සඳහන් වී ඇත. සංදේශ කාව්‍ය, භක්ති කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, සිලෝ කාව්‍ය, අස්න කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝෂ ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ ඒ අතර වේ. එලෙස ම ගිහි පැවිදි උගත් පඬිවරුන් රාශියක් ග්‍රන්ථකරණයෙහි නියැළීම ද, කොට්ටේ යුගයෙහි සාහිත්‍යයේ දියුණුවක් ඇති වීමට හේතු විය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වෑත්තෑවේ හිමි, විදාගම මෛත්‍රී හිමි, පැවිදි උගතුන් ලෙසත් හයවන පැරකුම්බා රජු ගිහි උගතෙකු ලෙසත් ග්‍රන්ථකරණයේ නිරත වූවන් අතර වේ. තව ද දියුණු පිරිවෙන් නිර්මාණය වීම ද හේතු විය. පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙන, කෑරගල පද්මාවතී පිරිවෙන එසේ බිහි වූ පිරිවෙන් අතර වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයෙහි සම්භාව්‍ය සාහිත්‍යයෙහි දියුණුවක් නිර්මාණය වූ ආකාරය සාහිත්‍යමය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු ඔස්සේ නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** කෝට්ටේ යුගය, ගිහි-පැවිදි උගතුන්, සම්භාව්‍ය සාහිත්‍ය, සාහිත්‍යයේ දියුණුව

# On the factors that influenced the development of classical Sinhala literature in the Kotte era An exploratory study

Madhushan I.M. M

Rajarata University of Sri Lanka

madushamilinda9@gmail.com

## Abstract

Due to Mahindagamana, Brahmi script was acquired from the 3rd century BC The beginning of writing also took place. In the early days, art of writing, such as cave letters can be noted. Then came literature. It is known as classical Sinhala literature. A classic Sinhala literature in each era of Ceylon, undergoing certain changes developed. In this way, Kotte's era can be named as an era in which literature developed. The aim of this research is to identify Reasons that influenced the development of literature in the period, with some selected historical sources. In periods The problem of this research is to study the reasons for the development. primary sources and secondary sources are investigated. Books were composed during the Kotte era is mentioned in this section. Sandesha Kavya, Bhakti Kavya, Hutan Kavya, Prashti Kavya, Silo Kavya, Asna Kavya, Upadesha Kavya, Kosha Granth, Dharma Granth are among them. In the same way, the layman is educated. A large number of scholars were engaged in book-writing, and the development of literature in the Kotte era can be noticed. Sri Rahula Thero of Thotagamuwe, Vettathewe Thero, Maithri Thero of Vidagama, as learned priests. King Parakumba VI was also engaged in writing books as a lay scholar. The creation of Piriven also led to an improvement in the literature of the Kotte era. Papiliana Sunetra Devi Pirivena, Keragala Padmavathi Pirivena, Devinuwara Irugalthilaka Pirivena were some prestigious academic institutions. A development of classical literature in Kotte period can be deduced from the information mentioned in the literary sources.

**Keywords:** Books, Classics, Kotte era, Literature